# ඉස්ලාම්

## 3 ශ්‍රේණිය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

| | | |
|---|---|---|
| **පළමුවන මුද්‍රණය** | **-** | **2017** |
| **දෙවන මුද්‍රණය** | **-** | **2018** |
| **තුන්වන මුද්‍රණය** | **-** | **2019** |
| **සිව්වන මුද්‍රණය** | **-** | **2020** |

සියලු ම හිමිකම් ඇවිරිණි.

ISBN 978-955-25-0233-0

**අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්**
**අංක. 90, වාසනාවත්ත පාර, මත්තේගොඩ දරන ස්ථානයෙහි පිහිටි**
**විශ්ව ග්‍රැෆික්ස් (පුද්ගලික) සමාගමෙහි මුද්‍රණාලයේ මුද්‍රණය කරවා**
**ප්‍රකාශයට පත් කරන ලදි.**

Published by : Educational Publications Department
Printed by : Vishwa Graphics (Pvt) Ltd.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙනයනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

# පෙරවදන

මනුගුණදම් සුරකින්නට නිති කැපවුණු කුසලතා පිරි මනුෂ්‍ය වර්ගයාට මේ ලෝකය වඩාත් සොඳුරු බිමක් බවට පත් කළ හැකි ය. ඒ සඳහා රටක අධ්‍යාපනය නිරතුරුවම බලසම්පන්න කරගතයුතු වන්නේ අනාගත වැඩලොව පිළිබඳව ද මනා අවදියෙන් සිටිමිනි. දිනෙන් දින විශ්ව ගම්මානය වෙත එක්වන සාරවත් නව දැනුම අපේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සමඟ මුසුකර ගැනීම අනිවාර්යයෙන් සිදුවිය යුතු අතරම අපගේ යහගුණදම් ද ඒ හා ඒකාත්මික කරගන්නට අමතක නොකළ යුතු ය. මෙම සාධනීය ගුණාංග රැකගනිමින් වඩාත් යහපත් සිසු පරපුරක් නිර්මාණය කිරීමේ උත්කෘෂ්ට මෙහෙවරට අවැසි ගුණාත්මක ඉගෙනුම් ආධාරක සම්පාදනය කිරීම අප දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ පරමාර්ථය බව අවධාරණය කරමි.

නේක විසිතුරු සිත්තම් හා අකුරුවලින් සපිරි මේ පෙළපොත් අනාගත ලොවට මඟ එළි දල්වන ප්‍රදීපස්තම්භ බඳු ය. ඔබ පාසල් බිමෙන් සමුගත් දිනක වුව, තුටින් සිහි කළ හැකි මිහිරි මතක, මේ පාඩම් පොත් පිටු අතර රැඳී තිබෙනු නිසැක ය. ගුරු තරුවල නොමඳ ආලෝකය ලබා ගනිමින් ඔබ මේ දැනුම හා වින්දනය කැටිකළ අනගි ත්‍යාගයෙන් නිසි පල නෙළා ගත යුත්තේ තව තවත් දැනුම් අවකාශ වෙත යුහුසුලුව පියමනිමිනි. රජය පෙළපොත් වෙනුවෙන් වැය කළ අප්‍රමාණ වූ ධනස්කන්ධයට අමිල අගයක් ලබා දිය හැක්කේ පාසල් සිසු දරු දැරියන් වූ ඔබට පමණි. දිවිය වෙත හඹා එන අනේක බාධක දිරියෙන් ජයගෙන, හෙට ලොව සුපුෂ්පිත කරවන්නට දැයේ දරුදැරියන්ට හැකිවේවායි අප්‍රමාණ ස්නේහයෙන් ආශීර්වාද කරන්නෙමි.

පෙළපොත් සම්පාදන ක්‍රියාවලිය වෙනුවෙන් මනා කැපවීමකින් සම්පත්දායකත්වය සැපයූ ලේඛක, සංස්කාරක හා ඇගයුම් මණ්ඩල සාමාජික පිරිවරටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සැමටත් මාගේ හදපිරි ස්තුතිය පිරිනමමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2020.06.26

## නියාමනය හා අධීක්ෂණය

**පී.එන්. අයිලප්පෙරුම** — **අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,**
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

## මෙහෙයවීම

**ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි** — **අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන),**
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

## සම්බන්ධීකරණය

**එම්. ටී. අබ්දුර් රහ්මාන්** — **සහකාර කොමසාරිස්,**
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

**අයි.ඒ.එම්. අෆ්සාන්** — **සහකාර කොමසාරිස්,**
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

## ලේඛක මණ්ඩලය

**එස්. එම්. ආර්. සුදීන්** — **ගුරු අධ්‍යාපනඥ,**
සහිරා විද්‍යාලය කොළඹ 10

**එම්. එච්. එම්. නාලිර්** — **සම්පත් පුද්ගල,**
ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

**ජ්‍යෙෂ්ඨ ගුරු** (විශ්‍රාමලත්).

**එස්. ඒ. සී. එම්. කරාමත්** — **විශ්‍රාමලත් විදුහල්පති.**

## සංස්කාරක මණ්ඩලය

**ඉසෙඩ්. තාජුදීන්** — **අධ්‍යක්ෂ,**
මුස්ලිම් පාසල් සංවර්ධන අංශය,
අධ්‍යාපන අමාත්‍යංශය.

**ඒ. අබ්දුල් සමදු** — **නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ,**
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
උතුරු මැද පළාත, අනුරාධපුරය.

**ජේ. ඩී. කරීම්දීන්** — **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,**
අධ්‍යාපන පීඨය, වවුනියා විශ්ව විද්‍යාලය,
නාවල, නුගේගොඩ.

**ජේ. එම්. ජසාර්** — **කථිකාචාර්ය, ආගමික ඒකකය,**
ජාතික අධ්‍යාපන ආයතය, මහරගම.

**පරිගණක සහායක**

**එස්. ඒ. අස්රිනා**

**පරිගණක අංශය,**
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

**පිටු සැකසුම**

**එච්. එෆ්. රිස්නා**

**පරිගණක අංශය,**
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

**චිත්‍ර හා පිටකවර**

**චිත්‍ර ශිල්පි එම්. ජේ. එම්. මන්සූර්**

**නියෝජ්‍ය විදුහල්පති,**
විද්‍යාලෝක මහා විද්‍යාලය,
බලංගොඩ.

# පටුන


1. අල්ලාහ් අප පෝෂණය කරන්නා ය 1
2. අල්ලාහු රාසිකුනා 3
3. කලිමතුත් තම්ජීද් 4
4. උචිත අවස්ථාවල කීමට පුරුදු වෙමු 6
5. මලක්වරු 8
6. මලක්වරුන්ගේ කාර්යයන් 10
7. අල්කුර්ආන් - 1 12
8. අල්කුර්ආන් - 2 14
9. වුලූඃ කරමු 16
10. වුලූඃ කරන අවස්ථා 20
11. සලාතය ඉටු කරන ආකාරය - 1 22
12. සූරතුල් ෆාතිහා 26
13. සලාතය ඉටු කරන ආකාරය - 2 28
14. අත්තහියියාත් 31
15. හොඳ දරුවා 33
16. හොඳ පන්තිය 35
17. හොඳ ශිෂ්‍යයා 37
18. හොඳ ශිෂ්‍යයන් 39
19. අන් අය අගය කරමු 41
20. සංග්‍රහය 43
21. පරිසරය පිරිසිදුව තබමු 45
22. සතුටුදායක නිවස 47
23. පරිත්‍යාග කළ යුවළ 49
24. නබි صلى الله عليه وسلم තුමාගේ යහගුණාංග - 1 51
25. නබි صلى الله عليه وسلم තුමාගේ යහගුණාංග - 2 53
26. පඬිවරයාගේ ආදර්ශය 56

# 1 අල්ලාහ් අප පෝෂණය කරන්නා ය

අල්ලාහ් ආදරවන්තයා ය.

ඔහු කරුණාව ඇත්තෙකි.

අහස මැව්වේ ඔහු ය.

පොළොව මැව්වේ ද ඔහු ය.

ඔහු පොළොවේ ජීවීන් මැව්වේ ය.





ඔහු ජීවීන් පෝෂණය
කිරීමට ශාක වවන්නේ ය;

ශාක වැඩෙන්නට වර්ෂාව
වස්සවන්නේ ය;

පොළොව වර්ෂාවෙන් සරු කරවන්නේ ය;

පොළොවේ ඇති සියල්ලට ම

ආහාර ලබා දී පෝෂණය කරන්නේ ය;

රස්සාක් වන්නේ ඔහු ය.

**අභ්‍යාස :**

**සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(කරුණාව, රස්සාක්, ජීවීන්, අල්ලාහ්, වර්ෂාව)

1) ............................ අහස මැව්වේ ය.

2) අල්ලාහ් පොළොවේ .......................... මැව්වේ ය.

3) ඔහු ශාක වැඩීමට ............................ වැස්සවී ය.

4) ඔහු ............................ ඇත්තෙකි.

5) ඔහු ............................ වන්නේ ය.

# 2 අල්ලාහු රාසිකුනා




| | | | |
|---|---|---|---|
| අල්ලාහු | හාලිකුනා | අප මැව්වාවූ | අල්ලාහ් |
| අල්ලාහු | රාසිකුනා | අප කුස පිරවූ | අල්ලාහ් |
| අල්ලාහු | හාදීනා | යහ මග පෙන්වන | අල්ලාහ් |
| සුබ්හාන | මව්ලානා | පරිශුද්ධ ස්වාමියා | අල්ලාහ් |

**අභ්‍යාස :**

පාඩමේ ඇති අරාබි ගීතය මිහිරිව ගායනය කරන්න.

මෙම ගීතයෙහි සඳහන් අල්ලාහ්ගේ ගුණාංග තුනක් ලියන්න.

# 3 කලිමතුත් තම්ජීද්

كَلِمَةُ التَّمْجِيْد

سُبْحَانَ اللهِ وَالْحَمْدُ لِلهِ وَلَا اِلٰهَ
اِلَّا اللهُ وَاللهُ اَكْبَرُ وَلَا حَوْلَ
وَلَا قُوَّةَ اِلَّا بِاللهِ الْعَلِيِّ الْعَظِيْمِ

සුබ්හානල්ලාහි වල්හම්දුලිල්ලාහි වලා ඉලාහ
ඉල්ලල්ලාහු වල්ලාහු අක්බර් වලා හව්ල
වලා කුව්වත ඉල්ලා බිල්ලාහිල් අලියියිල් අලීම්.

අල්ලාහ් පාරිශුද්ධ කරමි.
සියලු ප්‍රශංසා අල්ලාහ්ට ය.
නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර
අන් කිසිවෙක් නොවේ.
අල්ලාහ් අති උසස් වේ.
උත්තමයා ද මහාන්තය ඇත්තා ද වන,
අල්ලාහ්ගේ උදව්වෙන් තොරව ශක්තිය හෝ
බලය නොමැත.

මෙම කලිමාව කටපාඩම් කරමු.
උචිත අවස්ථාවල පාරායනය කරමු.

## අභ්‍යාසය :

**සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(නැමදුමට සුදුස්සා, අති උසස්, අල්ලාහ්, ප්‍රශංසා, අල්ලාහ්ගේ)

01. මම ........................ පාරිශුද්ධ කරමි.
02. සියලු ම ...................... අල්ලාහ්ට ය.
03. අල්ලාහ් හැර ........................ කිසිවකු නැත.
04. අල්ලාහ් ............................ ය.
05. ......................... උදව්වෙන් තොරව කිසිවක් කළ නොහැකි ය.

# 4 උචිත අවස්ථාවල කීමට පුරුදු වෙමු



පුදුම උපදවන යමක් දුටු විට

سُبْحَانَ اللّٰهِ සුබ්හානල්ලාහ්

කියමු.



අල්ලාහ්ගේ දයාද ලැබෙන විට

اَلْحَمْدُ لِلّٰهِ අල්හම්දුලිල්ලාහ්

කියමු.

අපගේ ක්‍රියා යහපත් අන්දමින් පවතින විට

## اَللهُ اَكْبَرُ අල්ලාහු අක්බර්

කියමු.

| | |
|---|---|
| سُبْحَانَ اللهِ | අල්ලාහ් පාරිශුද්ධයා ය. |
| اَلْحَمْدُ لِلهِ | සියළු ප්‍රශංසා අල්ලාහ්ට ය. |
| اَللهُ اَكْبَرُ | අල්ලාහ් අති උසස් ය. |

## අභ්‍යාස :

යාකරන්න.

| (අ) | (ආ) |
|---|---|
| අල්ලාහ් පාරිශුද්ධ කිරීමට | අල්ලාහු අක්බර් |
| අල්ලාහ්ට ගෞරව කිරීමට | අල්හම්දුලිල්ලාහ් |
| අල්ලාහ්ට ප්‍රශංසා කිරීමට | සුබ්හානල්ලාහ් |

# 5 මලක්වරු

මලක්වරු අල්ලාහ්ගේ මැවුම් වෙති.

අල්ලාහ් ඔවුන් මැව්වේ ආලෝකයෙන් ය.

එම නිසා ඔවුහු විශේෂ අය වෙති.

ඔවුහු නිරතුරු ව ම අල්ලාහ්ට යටහත් පහත් ව හැසිරෙති.

ඔවුන්ගේ සංඛ්‍යාව දන්නේ අල්ලාහ් පමණි.

ඔවුන්ගෙන් දහදෙනෙක් වැදගත් අය වෙති.

ඒ මෙසේ යː

01. ජිබ්රීල් අලෛහිස්සලාම්
02. මීක්කායීල් අලෛහිස්සලාම්
03. ඉස්රාෆීල් අලෛහිස්සලාම්
04. ඉස්රායීල් අලෛහිස්සලාම්
05. මුන්කර් අලෛහිස්සලාම්
06. නකීර් අලෛහිස්සලාම්
07. රකීබ් අලෛහිස්සලාම්
08. අතීද් අලෛහිස්සලාම්
09. මාලික් අලෛහිස්සලාම්
10. රිල්වාන් අලෛහිස්සලාම්

## අභ්‍යාස :

**අ) හරි වැරැදි ලකුණු කරන්න.**

1 මලක්වරුන්ගේ සංඛ්‍යාව දන්නේ අල්ලාහ් පමණි. ( )

2.අල්ලාහ් ඔවුන් මැව්වේ පසෙනි. ( )

3 මලක්වරු අල්ලාහ්ගේ මැවුම් ය. ( )

4.ඔවුහු අල්ලාහ්ට වෙනස්කම් කරති. ( )

ආ) වැදගත් මලක්වරු දහදෙනාගේ නම් කටපාඩම් කර කියන්න.

# 6 මලක්වරුන්ගේ කාර්යයන්

අල්ලාහ් මලක්වරුන් මවා ඇත. ඔවුනට විවිධ කාර්යයන් පවරා ඇත. ඒ අතර මලක්වරුන් දස දෙනකුට විශේෂ කාර්යය පවරා ඇත. ඒවා පහත දක්වේ.

දේව පණිවිඩය නබිවරුන්ට
මිහිරි ව කියන්නේ ජිබ්රීල් ය.
ජලාශ හා සුළඟ භාරව
සිටින්නේ මීක්කායීල් ය.

සූර් පිඹිනා මලක් වී
සිටින්නේ ඉස්රාෆීල් ය.
මිනිස් ප්‍රාණය ගන්නට
යොදවා සිටිනා මලක් ඉස්රායීල් ය.

කබ්රයේ ප්‍රශ්න අසන්නට
එන්නේ මුන්කර් සමගින් නකීර් මලකුන් ය.
මිනිසුන් කරනා කුසල් ලියනා
මලක්වරයා වන්නේ රකීබ් ය.

කරනා අකුසල් සටහන් කරනා
මලක්වරු වන්නේ අතීද් ය.
ස්වර්ගය බාරය රිල්වාන්ට නම්
නිරය බාරව ඉන්නේ මාලික් ය.

**දස දෙනා පිළිගෙන හැසිරෙමු.**

# අභ්‍යාස :

යාකරන්න.

| | |
|---|---|
| රකීබ් අලෛහිස්සලාම් | දූත මෙහෙවර කරන මලක්වරයා |
| ජිබ්රීල් අලෛහිස්සලාම් | ස්වර්ගයේ අධිපති |
| අතීද් අලෛහිස්සලාම් | කුසල් සටහන් කරන මලක්වරයා |
| මාලික් අලෛහිස්සලාම් | සූර් පිඹින්නා |
| ඉස්රාෆීල් අලෛහිස්සලාම් | වැරදි සටහන් කරන්නා |
| රිද්වාන් අලෛහිස්සලාම් | නිරයේ අධිපති |

# 7 අල්කුර්ආන් - 1



අල්කුර්ආන් අපගේ ආගමික ග්‍රන්ථයයි.

එය පහළ කරන ලද්දේ අල්ලාහ් විසිනි.

මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට එය පහළ කරන ලදි.

එතුමාණෝ එය දේශනා කළහ.

අල්කුර්ආන් අරාබි භාෂාවෙන් පහළ කරන ලදි.

අල්කුර්ආන් ශුද්ධ වූ ග්‍රන්ථයකි.

## අභ්‍යාස :

**සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(අල්ලාහ් විසින්, ශුද්ධ වූ, අල්කුර්ආන්, අරාබි)

1. අපගේ ආගමික ග්‍රන්ථය .............................. වේ.
2. එය .................................... පහළ කරන ලදි.
3. එය .................................... ග්‍රන්ථයයි.
4. එය .................................... භාෂාවේ ඇත.

# 8 අල්කුර්ආන් - 2



අල්කුර්ආනය වුලූඃ සමඟ ස්පර්ශ කරමු.

අඌදු, බිස්මිල් කියා පාරායනය කරමු.

එය පාරායනයට අවධානයෙන් සවන් දෙමු.

දිනපතා එය පාරායනය කරමු.

එය පාරායනය කිරීමෙන් කුසල් හිමි වේ.

එය ඉගෙන ගෙන ඒ අනුව හැසිරෙමු.

ඒ අනුව කටයුතු කිරීමෙන් ස්වර්ගය හිමි වේ.

## අභ්‍යාස :

සුදුසු වචන යොද හිස්තැන් පුරවන්න.

(දිනපතා, වුලූඃ සමඟ, අද්‍ දු බිස්මිල්, කුසල්, ස්වර්ගය)

1. අල්කුර්ආනය ............................ ස්පර්ශ කරමු.

2. එය ............................ පාරායනය කරමු.

3. ඒ අනුව හැසිරීමෙන් ............................ හිමි වේ.

4. එය පාරායනය කිරීමෙන් .......................... ලැබේ.

5. අල්කුර්ආනය ............................ කියා ආරම්භ කරමු.

# 9 වුලූඃ කරමු

අපි නැමදුමට පෙර වුලූඃ කරමු.

එය පහත සඳහන් පිළිවෙළට කරමු.

වුලූඃ කිරීමට පිරිසිදු ජලය භාවිත කරමු.



පළමුව මැණික් කටුව
දක්වා දෙඅත්
සෝදමු.



කට සෝදමු.

නහයට ජලය
යවා පිරිසිදු කරමු.






“වුලූඃ කරමි” යන නියියතය
සමග මුහුණ සෝදමු.



ඒ සමග ම
වැලමිට ඇතුළුව
දෑත් සෝදමු.



පසුව හිස
ජලයෙන්
(මස්හ්) පිරිමදිමු.



දෙකන් ජලයෙන්
පිරිමදිමු.



පසුව වළලුකර
ඇතුළුව දෙපා
සෝදමු.

සැම විට ම දකුණු පැත්ත පෙරටු කරමු.

අල්ලාහ් සිහි කර වුලූඃ කිරීම වැදගත් ය.

## අභ්‍යාස :

(ආ) කොටසින් පිළිතුරු තෝරා ලියන්න.

### (අ) කොටස

1. වුලූඃ කිරීමට කුමන ආකාරයේ ජලය අවශ්‍ය ද?
2. නියියතය තැබිය යුත්තේ කුමන අවයව සෝදන අවස්ථාවේ ද?
3. මුහුණ සේදූ පසුව සේදිය යුත්තේ කවර අවයව ද?
4. හිසට කුමක් කළ යුතු ද?
5. කුමන කොටස දක්වා පාද සේදිය යුතු ද?

### (ආ) කොටස

1. වළලුකර ඇතුළු ව
2. දෑත්
3. මුහුණ
4. පිරිසිදු ජලය
5. ජලයෙන් පිරිමැදිය යුතු ය

# 10 වුලූඃ කරන අවස්ථා

අප සැම විට ම පිරිසිදු ව සිටිය යුතු ය. නැමෙන් පිරිසිදුව සිටිනා සේ ම වුලූඃ කර පිරිසිදු විය යුතු ය.

එසේ පිරිසිදු ව සිටීම ගැන අල්ලාහ් කැමැත්තේ ය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ද එයට කැමැති වූහ. එහෙයින් පහත අවස්ථාවල වුලූඃ කර ගනිමු.

## වුලූඃ කරන අවස්ථා

- ★ උදේ අවදි වූ වහා ම
- ★ සලාතයට පෙර
- ★ අල්කුර්ආනය ස්පර්ශ කිරීමට පෙර
- ★ නිදගැනීමට පෙර
- ★ කඃබාව තවාෆ් කිරීමට පෙර

## අභ්‍යාස :

පහත ප්‍රකාශ නිවැරැදි නම් (✓) යැයි ද, වැරැදි නම් (×) යැයි ද සටහන් කරන්න.

1. වුලූඃ යනු මුළු ශරීරය ම පිරිසිදු කිරීමකි. (    )

2. වුලූඃ සමඟ සිටීමට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ කැමැත්තක් දැක්වූහ. (    )

3. වුලූඃ නොමැතිව සලාතය ඉටුකිරීමට පුළුවනි. (    )


4. වුලූඃ කරන අවස්ථාවේ අවයව තුනක් පිරිසිදු කළ යුතු ය. (    )

5. රාත්‍රි නින්දට පෙර වුලූඃ කළ යුතු ය. (    )

# 11 සලාතය ඉටු කරන ආකාරය - 1

අපි අල්ලාහ්ගේ ගැත්තෝ වෙමු. ඔහු සලාතය ඉටු කරන ලෙස අපට අණ කර ඇත. අප දිනපතා පස්වේලක් සලාත ඉටු කළ යුතු ය.

- සුබ්හු (අලුයම)
- ලුහර් (දහවල්)
- අසර් (සවස)
- මග්රිබ් (සැන්දෑවේ ඉර බැස යාමෙන් පසු)
- ඉෂා (රාත්‍රි)



සුබ්හු



ලුහර්



අසර්



මග්රිබ්




ඉෂා

අප සලාතය කරන
විට සිටගෙන ද
ඉන්නේ  ය.





නැමෙමින්
රුකූඋ කරන්නේ ය.



හිස බිම තබමින් සුජූද්
කරන්නේ ය.

සූරතුල් ෆාතිහා, අත්තහියියාත් යනාදිය වැදගත් පාරායනයන් වේ.

සලාතයේ තස්බීහ් (සුබ්හානල්ලාහ්), තහ්මීද් (අල්හම්දුලිල්ලාහ්), තක්බීර් (අල්ලාහු අක්බර්), ඉස්තිඃෆාර් (අස්තඃෆිරුල්ලාහ්) යන දික්රයන් පාරායනය කරමු.

දිනපතා සලාතය පස් වේල ඉටු කිරීම මුස්ලිම්වරුන්ගේ අනිවාර්ය යුතුකම වන්නේ ය.

**එම නිසා අපි සලාතය විධිමත් ව ඉටු කරමු.**

## අභ්‍යාස :

සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

( සූරතුල් ෆාතිහා, සුබ්හු, සුජූද්,
වේලාව, පස් වතාවක්)

1. දිනපතා ............................ සලාතය ඉටු කළ යුතු ය.

2. සලාතය ඉටු කිරීමට ............................ නියම කර ඇත.

3. සලාතයේ දී හිස පොළොවේ තැබීම ............................ නම් වේ.

4. අලුයම ඉටු කරනුයේ ............................ සලාතය වේ.

5. සලාතයේ දී අනිවාර්යයෙන් ම ............................ පාරායනය කළ යුතු ය.

# 12 සූරතුල් ෆාතිහා


سورة الفاتحة مكية وهي سبع آيات

بِسْمِ اللّٰهِ الرَّحْمٰنِ الرَّحِيْمِ

اَلْحَمْدُ لِلّٰهِ رَبِّ الْعٰلَمِيْنَ ۝١ الرَّحْمٰنِ
الرَّحِيْمِ ۝٢ مٰلِكِ يَوْمِ الدِّيْنِ ۝٣ اِيَّاكَ نَعْبُدُ
وَاِيَّاكَ نَسْتَعِيْنُ ۝٤ اِهْدِنَا الصِّرَاطَ
الْمُسْتَقِيْمَ ۝٥ صِرَاطَ الَّذِيْنَ اَنْعَمْتَ عَلَيْهِمْ ۝٦
غَيْرِ الْمَغْضُوْبِ عَلَيْهِمْ وَلَا الضَّآلِّيْنَ ۝٧

සූරතුල් ෆාතිහා පාරායනය කරන විට සවන් දෙමු.

පාරායනය කර පුරුදු වෙමු.


කටපාඩම් කරමු.

## අභ්‍යාස :

1. සූරතුල් ෆාතිහාව පාරායනය කරන්න.
2. සූරතුල් ෆාතිහාව කටපාඩම් කරන්න.

# 13 සලාතය ඉටු කරන ආකාරය - 2

සාහිල් වයස අවුරුදු හතක දරුවෙකි. ඔහු හැම දෙනාට ම උදවු කරයි. එම නිසා සාහිල් කීකරු හොඳ දරුවෙකු ලෙස හැම දෙනා ම අගය කරති.



අලුයම නැගිටින ඔහු තම පියා සමඟ **සුබ්හු** සලාතය ඉටු කිරීම සඳහා මස්ජිදයට යන්නේ ය.

එසේ ම දවල් කාලයේ දී සීයා සමඟ **ලුහර්** සලාතය සඳහා යන්නේ ය.

පස්වරුවේ **අසර්** සලාතය සඳහාත් තම මිතුරන් සමඟ යයි.

සැන්දෑවේ ඉර බැස යාමෙන් පසු **මග්රිබ්** සලාතය සඳහාත් වැඩිමල් සොහොයුරා සමඟ මස්ජිදයට යයි.

රාත්‍රියේ **ඉෂා** සලාතය සඳහා සීයා සමඟ යන්නේ ය. පස් වේල ම මස්ජිදයට ගොස් සලාතය ඉටු කරන ඔහු සන්සුන්ව සලාතය ඉටු කරයි.

අපි ද දිනපතා මස්ජිදයට යමු.

නිසි අයුරින් සලාතය ඉටු කරමු.

හොඳ දරුවන් වශයෙන් දියුණු වෙමු.

අල්ලාහ්ගේ ආදරය ලබා ගනිමු.

## අභ්‍යාස :

යාකරන්න.

පස්වේල් සලාතය ඉටු කරන්නේ කොයි වේලාවේ ද යන්න සුදුසු පරිදි යා කරන්න.

| | |
|---|---|
| 1. සුබ්හු | දහවල් කාලයේ |
| 2. ලුහර් | රාත්‍රී කාලයේ |
| 3. අසර් | අලුයම කාලයේ |
| 4. මඝ්රිබ් | පස්වරුවේ |
| 5. ඉෂා | සැන්දෑවේ (ඉර බැස යාමෙන් පසු) |

# 14 අත්තහියියාත්

සලාතයේ පාරායනය කළ යුතු වැදගත් පාරායනාවන් අතර අත්තහියියාත් ද එකකි.

اَلتَّحِيَّاتُ الْمُبَارَكَاتُ الصَّلَوَاتُ الطَّيِّبَاتُ لِلّٰهِ

اَلسَّلاَمُ عَلَيْكَ اَيُّهَا النَّبِيُّ وَرَحْمَةُ اللّٰهِ وَبَرَكَاتُهُ •

اَلسَّلاَمُ عَلَيْنَا وَعَلٰى عِبَادِ اللّٰهِ الصَّالِحِيْنَ •

اَشْهَدُ اَنْ لَآ اِلٰهَ اِلَّا اللّٰهُ

وَاَشْهَدُ اَنَّ مُحَمَّداً رَّسُوْلُ اللّٰهِ

اَللّٰهُمَّ صَلِّ عَلٰى مُحَمَّدٍ



අපිත් අත්තහියියාතය කටපාඩම් කරමු.

එය සලාතයේ දී පාරායනය කරමු.

## ක්‍රියාකාරකම්

අත්තහියියාත් කටපාඩම් කරන්න.

ඒවා පාරායනය කරන්න.

# 15 හොඳ දරුවා




හාජරා හොඳ දරුවෙකි.

ඇය දිනපතා ම දිය නායි;

සිරුරේ ඇති අපිරිසිදු දෑ ඉවත් කරයි;

තම ඇඳුම් සෝදා අඳියි;
තමා භාවිත කරන ද්‍රව්‍ය පිරිසිදු ව තබයි;

වැසිකිළිය ද පිරිසිදු ව තබයි;
දිනපතා විෂබීජ ඉවත් වන අයුරින් එය සෝදයි;

වැසිකිළි යාමට පෙර පාවහන් පැලඳ ගනියි;
අදාළ දුආව පාරායනා කරයි;

වමතින්, අපවිත්‍ර දෑ ඉවත් කර පිරිසිදු කරයි;
පිටවූ පසු ද ජලය වක්කරයි;

පිට වූ පසු දුආ පාරායනය කරයි;
වැසිකිළිය වසා තබයි;

අපි ද හොඳ පුරුදු අනුගමනය කරමින් යහපත් දරුවන් වශයෙන් වැඩෙමු.

## අභ්‍යාස :

හාජරා තමා පිරිසිදු කරගන්නා ආකාරය සඳහන් කරන්න.

# 16 හොඳ පන්තිය



දිනක් තුන් වන ශ්‍රේණියේ ළමයි ශ්‍රමදාන කටයුත්තක යෙදුණහ.

ඔවුහු පාසලේ පරිසරය පිරිසිදු කළහ.

සමහරු පාසලට යන මාර්ගය පිරිසිදු කළහ.

සමහරු වත්ත පිරිසිදු කළහ.

තවත් සමහරු පාසලට එන දෙමව්පියන් නැවතී සිටින පෙදෙස පිරිසිදු කළහ.

සමහරු ආපනශාලාව පිරිසිදු කළහ.

ඔවුන් සමග ගුරුවරු ද එක් වූහ.

දෙමව්පියෝ ද එක් වූහ.

විදුහල්පතිතුමා සියල්ලන්ට ම ස්තුති කළේ ය.

**පන්ති කාමර පරිසරය සෑම විට ම පිරිසිදු ව තබමු.**

**අභ්‍යාස :**

තුන්වන ශ්‍රේණියේ සිසුන් යෙදුණු ශ්‍රමදාන කටයුතු අවස්ථාවේ දී පිරිසිදු කළේ කවර තැන් ද?

1.
2.
3.
4.

# 17 හොඳ ශිෂ්‍යයා

රයිහාන් ඉගෙන ගන්නේ තුන්වන ශ්‍රේණියේ ය.

ඔහු දිනපතා ම අලුයම අවදි වන්නේ ය.



උදේ ම මුහුණ කට සෝද ලක ලෑස්ති වන්නේ ය.

වුලූඃ කර සලාතය ඉටු කරන්නේ ය.

අල්කුර්ආනය කටපාඩම් කරන්නේ ය.

පාසලට යන්නට සූදනම් වන්නේ ය.

ඔහු පොත් බෑගය කල් ඇතිව සූදනම් කර ගන්නේ ය.

දෙමව්පියන්ගෙන් සමුගෙන පාසල් යන්නේ ය.

නියම වෙලාවට පාසලට යන්නේ ය.

සලාම් කියා මඳහස පාමින් පන්තියට ඇතුළු වන්නේ ය.

පසුපසින් එන සොහොයුරන් පිබිදුණු මුහුණින් පිළිගන්නේ ය.

අපි ද නියම වෙලාවට නියම කාර්යයවල යෙදෙන්නට පුරුදු වෙමු.

**අභ්‍යාස :**

රයිහාන් යන ශිෂ්‍යයාගේ හොඳ ලක්ෂණ පහක් ලියන්න.

1.
2.
3.
4.
5.

# 18 හොඳ ශිෂ්‍යයන්

අපි හොඳ ශිෂ්‍යයෝ වෙමු.

ඕනෑ ම දෙයක් ක්‍රමවත් ව කරමු.

පන්තියට ඇතුළු වූ වහා ම, නියමිත ස්ථානයේ පොත් බෑගය තබමු.

මේස, පුටු පිළියෙල කරමු.

කසළ අහුලා හෝ අතුගා කසළ කූඩයට දමමු.

ගුරු මේසයට මේස රෙද්දක් එළමු.

මල් පෝච්චිය ගුරු මේසය මැද තබමු.

පන්තියට එන ගුරුතුමා සලාම් කියා පිළිගනිමු.



සලාතය ඉටු කරමු.


පවුලේ සාමාජිකයන් සමග එකතු වී දහවල් කෑම කමු.

අල්ලාහ්ට ස්තුති කරමු.

**අභ්‍යාස :**

ඔබ පන්ති කාමරය පිළිසකර කරන්නේ කෙසේ ද, යැයි ලියන්න.

# 19 අන් අය අගය කරමු



නසීම් විභාගයේ දී පළමුවැනියා වුණා. ඒ ගැන ඔහුගේ දෙමව්පියන් ඉතා සතුට ට පත් වුණා. ඔහුගේ පන්තියේ මිතුරන්ට ඔවුහු තේ පැන් සංග්‍රහයක් පැවත්වූ හ.

එමගින් ඔවුහු තම සතුට පෙන්වූ හ. නසීම් තම මිතුරන් සිනාමුසු මුහුණින් පිළිගත්තා. රසකැවිලි බෙදා දුන්නා. මිත්‍රශීලි ලෙස කතා කළා. සතුටින් ඇසුරු කළා.

පන්තියේ මිතුරන් නසීම්ට තෑග්ගක් දුන්නා. ඔහු ඔවුන්ට තම ස්තුතිය පුදකළා.

ඔහුගේ දෙමව්පියන් ද පන්තියේ මිතුරන්ට ප්‍රශංසා කළා.

## අභ්‍යාස :

**ගැළපෙන වචන යොදා හිස්තැන් පුරවන්න.**

1. නසීම් විභාගයෙන් ........................ ලැබුවා.

2. දෙමව්පියෝ ඔහුගේ මිතුරන්ට ........................ සංග්‍රහ කළා.

3. නසීම් මිතුරන් .............................. පිළිගත්තා.

4. මිතුරන් නසීම්ට ................................ දුන්නා.

# 20 සංග්‍රහය

දිනක් හාදිගේ නිවසේ විවාහ උත්සවයක් පැවැත්වුණා. උත්සවයට වැඩිහිටියනුත් අමුත්තනුත් මිතුරොත් ඇවිත් සිටියා.

හාදි වැඩිහිටියන් හා අමුත්තන් ගෞරවයෙන් පිළිගත්තා. සම්ප්‍රදායානුකූලව පිනිදිය ඉස්සා. දැත්වල සුවඳ ගල්වා ආරාධනා කළා.



අමුත්තන් ඔහුගේ ක්‍රියාව අගය කළා. ඔවුන් ඔහු සමඟ මුසාෆහා කළා. ඔවුන් ඔහු සිප ගත්තා. ඔහු ද ඒ අයගේ දෑත් සිප ගත්තා.

හාදි ඔවුනට සංග්‍රහ දී හොඳින් සැලකුවා.

වැඩිහිටියන් සහ අමුත්තන් හා මිතුරන් හාදිට ස්තුති කර සතුටින් තම නිවෙස්වලට ගියා.

## අභ්‍යාස :

**පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.**

1. හාදිගේ නිවසට පැමිණියෝ කවරහු ද?

2. හාදි වැඩිහිටියන් පිළිගත්තේ කෙසේ ද?

3. අවසානයේ හාදිගේ නිවසින් පිටවන විට අමුත්තන් කීවේ මොනවා ද?

# 21 පරිසරය පිරිසිදුව තබමු

ජනයා එක්රැස් වන ස්ථාන රාශියක් තියනවා. ඒවා අතරින් බස් නවාතැන් පොළත් එකක් වේ. එය මගීන්ට නැවතීම සඳහා සකස් කරන ලද එකක්.

එහි කුණු රොඩු දැමීම නොකළ යුතු ය. අපවිත්‍ර දේවල් තැන් තැන් වල විසි කිරීම නොකළ යුතු ය. එහි බිත්තිවල ලිවීම හෝ ඇඳීම නොකළ යුතු ය. දැන්වීම් ඇලවීම නොකළ යුතු ය. එහි කෙළ ගැසීම නොකළ යුතු ය.



මෙසේ ජනතාව එක්රැස් වන පොළවල්, කඩවීදි, ක්‍රීඩා පිටි ආදියත් අපිරිසිදු නොකර ආරක්ෂා කළ යුතු ය.

එවිට අපට සුවසේ ජීවත් විය හැකි ය.



පරිසරයේ පිරිසිදුකම සුරකිමු.

**අභ්‍යාස :**


පරිසරය පිරිසිදුව තබා ගැනීමට අප අනුගමනය කළ යුතු ක්‍රියාකාරකම් හතරක් ලියන්න.

1.
2.
3.
4.

# 22 සතුටුදායක නිවස

අප පිළිවෙළට, පිරිසිදුව මෙන් ම අලංකාරව ද සිටින්න ඕනෑ.

අපගේ නිවෙස් අලංකාරව හා පිරිසිදු ව හා පිළිවෙළට තියෙන්න ඕනෑ.



බඩු මුට්ටු අපිළිවෙලට නොතියෙන්න ඕනෑ.

ඇඳුම් තැන තැන දමා නොතියෙන්න ඕනෑ. ඒවා අලංකාර අයුරින් පිළිවෙළට තියන්න ඕනෑ.

විශේෂයෙන් ම නිදන කාමරය, ආහාර ගන්නා කාමරය, කුස්සිය යන තැන් ලස්සනටත් පිරිසිදුවටත් පිළිවෙළටත් තබන්න ඕනෑ.

නිවස සතුටුදයක නිවසක් වන්නේ එවිට ය. එම නිසා අපගේ නිවස අලංකාර ව හා පිරිසිදු ව තබා ගනිමු. එහි බඩු මුට්ටු ද පිළිවෙළට තබා ගනිමු.

## අභ්‍යාස :

ඔබගේ නිවස ඔබ අලංකාරව තබා ගන්නේ කෙසේ දැයි ලියන්න.

1.
2.
3.
4.

# 23 පරිත්‍යාග කළ යුවළ

සහාබිවරයකුගේ නිවසට දිනක් අමුත්තෙක් පැමිණියා. සහාබිවරයාගේ නිවසේ අමුත්තාට දෙන්නට තරම් කෑම තිබුණේ නෑ. අමුත්තා හිස් අතින් යැවීමට සහාබිවරයාට කැමැත්තක් තිබුණේ නෑ. එම නිසා ඔහු අමුත්තා පිළිගෙන සතුටින් උපස්ථාන කළා.

සහාබිවරයා තම බිරිය සමග රහසින් සාකච්ඡා කළා. තමන්ගේ රාත්‍රි කෑම අමුත්තාට දෙන්නට දෙදෙනා ම තීරණය කළා. කෑම ගන්නා අවස්ථාවේ එතැනට



ආ සහාබිවරයාගේ බිරිය පහනේ එළිය වැඩි කරනවා වගේ එය නිවා දමන්න කතා කර ගත්තා.

සහාබිවරයා ද අමුත්තා සමඟ කෑමට ඉඳ ගත්තා. ඒ අතර එතැනට පැමිණි සහාබි බිරිය පහන නිවා දැමුවා. අමුත්තා කෑම අනුභව කළ අතර සහාබිවරයා කෑම අනුභව කරන්නාක් මෙන් ඇඟෙව්වා. අනුභව කර අවසන් වූ පසු දෙදෙනා ම නැගිට්ටා.

අමුත්තා සතුටින් සමු ගත් අතර සහාබි හා සහාබි බිරිය අමුත්තාට සංග්‍රහ කර කුසගින්නෙන් ම සතුටින් නිදා ගත්තා ය.

**අභ්‍යාස :**

**පහත ඒවායින් හරි ඒවාට හරි යැයි ද, වැරැදි ඒවාට වැරැදි යැයි ද ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

1. සහාබිවරයා අමුත්තා පිළිගත්තා. ( )
2. ඔහු අමුත්තාට සංග්‍රහ කළේ නැත. ( )
3. සහාබිවරයා සහ බිරිය තම ආහාර අමුත්තාට දුන්නා. ( )
4. සහාබිවරයා ගේ බිරිය පහනේ එළිය වැඩි කළා. ( )
5. සහාබිවරයා හා බිරිය කුසගින්නෙන් ම නින්දට ගියා. ( )

# 24

# නබි صلى الله عليه وسلم තුමාගේ යහගුණාංග - 1

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා යහගුණයෙන් පිරුණු අයෙකි. එතුමා කුඩා වයසේ පටන් ම ඇත්ත කතා කළා. තව ද, විශ්වාසවන්තව හැසිරුණා.

එතුමා හලීමා මව්තුමියගෙන් කිරි බී හැදුණා. ඒ අවස්ථාවේ දී කිරි බිව්වේ දකුණු පැත්තෙන් පමණි. වම් පැත්තෙන් කිරි බීමට තම සහෝදරයාට ඉඩ දුන්නා.

එතුමා තම කිරි මවට ඉතා හොඳින් සැලකුවා. තමා හැදූ මව වූ ෆාතිමා බින්ත් අසද් මවුතුමියට ද ගෞරවයෙන් සැලකුවා. මෙතුමිය අබූතාලිබ්ගේ බිරිඳ ද වේ. එතුමියගේ අභාවයේ දී නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා බෙහෙවින් දුක් වුණා.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ යහගුණ ගැන අල්ලාහ් ද බෙහෙවින් ප්‍රශංසා කර ඇත.

## අභ්‍යාස :

අ) හරි හෝ වැරැදි යැයි සලකුණු කරන්න.

1. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා යහගුණයෙන් පිරුණු අයෙකි. ( )
2. එතුමා කුඩා අවධියේ ම සත්‍යය කතා කළා. ( )
3. එතුමා හලීමා මව්තුමියගේ වම්පැත්තෙන් කිරි බිව්වා. ( )
4. එතුමා තම හැදූ මවට ගෞරව දැක්වූවා. ( )

ආ) නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ යහගුණ තුනක් දක්වන්න.

1.
2.
3.

# 25

# නබි صلى الله عليه وسلم තුමාගේ යහගුණාංග - 2

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා හැදී වැඩුණේ හලීමා මව්තුමිය ළඟ ය.

එතුමා තම කිරි බොන සහෝදරයින් සමඟ සෙල්ලම් කරනවා.

දිනක් එතුමා තම සහෝදරයින් දුටුවේ නෑ.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා හලීමා තුමියගෙන් ''අම්මේ මාගේ සහෝදරවරු කොයි ද''යි කියා ඇසුවේ ය.

'ඔවුන් එළුවන් දක්කන්නට ගියා'' කියා හලීමා තුමිය පැවසුවේ ය.

''මාත් එයාලා එක්ක යන්න ඕනෑ'' කියා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා පැවසුවේ ය.

''හෙට ඔබට යන්න පුළුවන්'' කියා හලීමා තුමිය පැවසුවේ ය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ‘හොඳයි අම්මේ’ කියා එතුමියගේ කීමට ගරු කළා.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා කුඩා අවධියේ සිට ම මවට බරක් වීමට කැමැති වූයේ නැත.

අනෙක් අය මෙන් උපයා ජීවත් වීමට එතුමා බලාපොරොත්තු වුණා.

වැඩුණු පසුව, එතුමා මක්කා වැසියන්ගේ එළුවන් බලා ගත්තා. එය නබිවරුන්ගේ රැකියාව බව එතුමා කීවා.

තරුණ වියේ දී මහප්පා සමඟ වෙළෙඳාමට ගියා. වෙනත් කණ්ඩායම් සමඟ ද වෙළෙඳාමේ ගියා.

කදීජා යන සිටුවරියගේ ද්‍රව්‍ය ද රැගෙන ගියා.

එතුමාගේ අවංකත්වය දැක සියල්ලන් ම අගය කළා.

**අපිත් එතුමා අනුගමනය කරමු.**

**අභ්‍යාස :**

'ආ' කොටසින් පිළිතුරු තෝරා ලියන්න.

(අ) කොටස

1. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා
2. එළුවන් බලා ගැනීම
3. එතුමා කදීජා රළියල්ලාහු අන්හා තුමිය සමග
4. එතුමන්ගේ යහගුණ

(ආ) කොටස

1. නබිවරුන්ගේ රැකියාවකි.
2. මහප්පා සමග වෙළෙඳාමේ ගියා.
3. අල්ලාහ් ප්‍රශංසා කළා.
4. වෙළඳාම් කළා.

# 26 පඬිවරයාගේ ආදර්ශය



නුඃමාන් යන නමින් යුත් පඬිවරයෙක් සිටියා.

එතුමා ඉමාම් අබූ හනීෆා රහ්මතුල්ලාහි අලෛහි කියා ද හැඳින්වුණා.

එතුමා උගත්කමත් යහගුණයත් සහිත අයෙක් වුණා. ඔහුගේ අසල්වැසියා වුණේ දුප්පත් අයෙකි. ඔහු දහවල් කාලයේ රැකියාවට යයි. රාත්‍රියේ දී මත්පැන් පානය කරයි. මත් වී සින්දු කියමින් පසුවෙයි.

එය ඉමාම්වරයාට ඉමහත් කරදරයක් හා බාධාවක් වුණා. ඒත් එතුමා කිසි දවසක ඒ ගැන කිසිවකුටත් පැමිණිලි කළේ නෑ.

දිනක් ඔහුගේ අසල්වැසියා රජුගේ භටයන් විසින් අත් අඩංගුවට ගනු ලැබුවා. එය අසන්නට ලැබුණු ඉමාම්වරයා කනගාටු වුණා.

වහා ම මුරභටයින් වෙත ගොස් ඔහු නිදහස් කරන ලෙස ඉල්ලා සිටියා.

නිදහස ලබා පැමිණි ඔහු ඉමාම් තුමාගෙන් සමාව ඉල්ලුවා.

එදා පටන් ඔහු නරක ක්‍රියා අතහැර දැම්මා. යහපත් මිනිසකු ලෙස ජීවත්වීමට පටන් ගත්තා.

**හොඳ පුද්ගලයින් දැකීමත් හොඳ ය.**

## අභ්‍යාස :

**කෙටි පිළිතුරු සපයන්න.**

1. ඉමාම් අබූ හනීෆා රහ්මතුල්ලාහි අලෛහි තුමාගේ නියම නම කුමක් ද?
2. ඔහුගේ අසල්වැසියා රාත්‍රියේ දී කුමක් කරනවා ද?
3. ඉමාම් තුමා එයට කැමැති වූවා ද?
4. ඔහුගේ වරද ගැන පඬිතුමා කිසිවකුට පැමිණිලි කළා ද?
5. ඔහු අත් අඩංගුවට ගත්තේ කවුද?
6. ඉමාම්, මුරභටයින් හමුවන්නට ගියේ ඇයි?
7. නිදහස ලැබූ ඔහු ඉමාම්ගෙන් ඉල්ලා සිටියේ කුමක් ද?
8. අවසානයේ දී අසල්වැසියා කෙසේ වෙනස් වූවා ද?